# 2018 දෙසැම්බර් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"ජෙරුසලම, නැගිටින්න, බැබලෙන්න ඔබේ ආලෝකය
දැන් උදා වී ඇත. සමිඳුන්ගේ තේජාලංකාරය
ඔබ කෙරෙහි බැබලේ "** (යෙසායා 60:1)

ආගමන සමය හෙවත් නත්තල් කාලය උදා වී ඇත. නත්තලේ සැබෑ අර්ථය වන්නේ ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමට සූදානම් වීමයි. අද බොහෝ දුරට බොහෝ කිතුනුවන් නත්තල හුදෙක් බාහිර ගෝෂාවට හා කන බොන, අඳින පළඳින උත්සවයක් කර ගැනීම ඉතාමත් කණගාටුදායක ය.

එහෙත් බෙත්ලෙහෙමේ එදා ගව මඩුවක උපන් ජේසු සමිඳාණෝ මුළු මිනිස් සංහතියේම පාපයේ විපාකයන් කරට ගෙන කුරුසියේ ඇණගැසුම් කා මරණයෙන් උත්ථාන වී ස්වර්ගස්ථ වී නැවත දෙවන වර විරාජමානව පැමිණෙන බවට පොරොන්දු වුවත්, අදත් ඔවුන් වහන්සේ අප අතර ප්‍රකාශ වන සේක. විශේෂයෙන් දිව්‍ය පූජා යාගය තුළත් දිව්‍ය සත්ප්‍රසාදය තුළ මාංශගතවී අපට ආහාරයක් වීමත්, අපගේ එකමුතුකම තුළ මෙන්ම විවිධ සිද්ධීන් තුළ ඔවුන් වහන්සේව අපට අත්දැකීමට හැකිය.

නිරන්තරයෙන් ජේසු ක්‍රිස්තුන් වහන්සේව හමුවීම, ඇසුරු කිරීම, අත්දැකීම නියම නත්තලයි. අයැදීමේ සේවකයන් වශයෙන් මේ ආගමන සමය පුරාවටම සමස්ථ කිතුනු ජනතාවට නිරන්තරයෙන්ම ජේසු සමිඳාණන් තුළ ජීවත් වන, ඔවුන් වහන්සේව අත්දකින සැබෑ නත්තලක් තුළ තම පවුලට, තම ගමට, මුළු රටටම ජීවමාන ක්‍රිස්තුන් වහන්සේව තම ජීවිත සාක්ෂියෙන් ප්‍රකාශ කිරීමට ශුද්ධාත්ම වරප්‍රසාද ලැබේවා'යි මැදහත් වී යාච්ඤා කරමු.

මේ මාසික සුපුවත තුළින් අපි 'ශ්‍රී ලංකාව නැගිටින්න, බැබලෙන්න ඔබේ ආලෝකය දැන් උදා වී ඇත. සමිඳුන්ගේ තේජාලංකාරය ඔබ කෙරෙහි බැබලේ' යන වචනය යථාර්ථයක් වීම සඳහා ශ්‍රී ලංකා දේශය වෙනුවෙන් ද යාච්ඤා කරමු.

**"මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත.
දිළිඳුන්ට සුභ අස්න දෙසීමට ද, බිඳුණු සිත් ඇත්තන්ට සුව සෙත දීමට ද,
වහලුන්ට මිදීම දානය කරන්නට ද, සිරකරුවන්ට නිදහස දන්වන්න ද
එතුමාණෝ මා ආලේප කළ සේක."** (යෙසායා 61:1)

පළමු සතිය : දිව්‍යමය කියවීම - යෙසායා 61:1-3
අයැදීමට විශේෂ යොමුව :

ආගමන සමය තුළ සියලුම කිතුනු ජනතාවට පශ්චත්තාපයෙන් සහ මනස්ථාපනයෙන් යුතුව නත්තල අර්ථවත්ව සැමරීමට අවශ්‍ය ශුද්ධාත්ම බලය ලැබෙන පිණිස යාච්ඤා කරමු.
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ස්වාමි තාත්තා වෙනුවෙන්
* දිවැසි එකතුව, සහයක එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම ගන්නා සියළු දෙනා වෙනුවෙන්
* දෙසැම්බර් 02 වන ඉරිදා පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්
* දේශපාලන ක්ෂේත්‍රය තුළ පවතින අර්බුදයන් තුළින් ජනතාවට යහපත උදා වන පිණිස
* දෙසැම්බර් 8-9 දිනවල තඹරවිල, වෙන්නප්පුව සාංඝික සඳහා පැවැත්වෙන යැදුම් පාසලට සහභාගි වන සියළු දෙනාටත්, වචනයේ සේවකයන්ටත් ශුද්ධාත්මාලෝකය ලැබෙන පිණිස.
* වෙනත් අයැදීම් ....

දෙවන සතිය : දිව්‍යමය කියවීම - බාරුක් 5:1-9
අයැදීමට විශේෂ යොමුව :

දේශය තුළ පවතින විෂමතා දුරු වෙමින් අප රට තුළ සැබෑ සංහිඳියාවක් ඇතිවන පිණිස
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ජනාධිපති ඇතුළු දේශපාලඥයන් වෙනුවෙන්
* ශුද්ධෝත්තම පියතුමා ඇතුළු රදගුරු, පූජක, පැවිදි සහ දහම් පාසල් ගුරුවර - ගුරුවරියන් වෙනුවෙන්.
* මත්පැන්, මත් ද්‍රව්‍ය ඇතුළු විවිධ අපචාරයන්ට භාජනය වූවන් සහ ඔවුන්ගේ පවුල්වල සියළු දෙනා වෙනුවෙනුත්, මත් ද්‍රව්‍ය ජාවාරම් කරුවන් හට තමන් කරන වරදෙහි බරපතලකම තේරුම් ගැනීමට අවශ්‍ය ප්‍රඥාව ලැබෙන ලෙස
* විදේශ රටවල පුබුදු සංඝයන් සහ එහි වගකීම ගන්නා අය වෙනුවෙන්.
* අයැදීම් එකතුවලට සහභාගි වන සියළු දෙනා සහ අයැදීම් සහයක එකතුව වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 4:4-7
අයැදීමට විශේෂ යොමුව :

ශ්‍රී ප්‍රශංසාරාමයේ අළුතින් ඉදිකර ගෙන යන යාච්ඤාංගනයේ වේදිකාව නිම කිරීමට අවැසි ප්‍රතිපාදන ලැබෙන පිණිස (විනාඩි 05ක් පමණ)

වෙනත් අයදැම් :

* දුරස්ථර ප්‍රදේශවල පුබුදු සංඝයන් වෙනුවෙන්
* චාම් සරල විවාහ හා සුදු මුදු විවාහයන්ට ඇතුළු වූ සියළුම යුවල් සහ පවුල් වෙනුවෙන්
* පවුල්වල ශුද්ධවූ ජපමාලයට සහ පවුලේ යාච්ඤාවට මුල් තැනක් ලැබෙන පිණිස
* මුල් කාලයේ බ්‍රහස්පතින්දා දිනවල පුබුදු පවුල්වල අයට පවුල් යාගය කිරීම ප්‍රමුඛතාවයක් වශයෙන් සැලකූ හෙයින් නැවතත් බ්‍රහස්පතින්දා දිනවල පුබුදු නිවෙස්වල පවුල් යාගයට දොරටු විවෘත වන පිණිස.
* වෙනත් අයැදීම් ....

සතරවන සතිය : දිව්‍යමය කියවීම - යෙසායා 9:2-7
අයැදීමට විශේෂ යොමුව :

ශුද්ධවූ සභාව වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* මහළු මඩම්වල, අනාථ නිවාසවල, සිරගෙවල්වල, පුනරුත්ථාපන මධ්‍යස්ථානවල, මානසික රෝහල්වල නේවාසිකව සිටින සියළු දෙනා සහ මහමඟ සිඟාකන යාචකයන්, කොරු, අන්ධ, අබ්බගාත සියළු දෙනා වෙනුවෙන්
* ප්‍රශංසාරාමයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභිමුව අඛණ්ඩව යාච්ඤාවේ යෙදෙන කණ්ඩායම වෙනුවෙන්.
* ප්‍රශංසාරාමයේ පුබුදු කාර්යාලය, පුබුදු මුද්‍රණාලය, ව්‍යාප්ති සේවාව, සුදතුම් ගමන සඟරාවට ලිපි සපයන සහ සංස්කරණය කරන අය ඇතුළුව, සුදතුම් ගමන සඟරාව බෙදා හරින අය වෙනුවෙන්
* වෙනත් අයැදීම් ....

**ආලේලූයියා ආලේලූයියා !**
**අති උසස් දෙවිඳුන්ට මහිමය ද,**
**මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා !**
**ආලේලූයියා**

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************